- ✓ ***<u>නැවෙත් බාපු මිලට ඉන්ධන දෙන්න ආපු ආණ්ඩුව අද ඉන්ධන පාරිභෝගිකයා අසීමාන්තිකව ගසා කනවා…</u>***

- ✓ ***<u>මිල සූත්‍රයත් නෑ… ඉන්ධනවල ප්‍රමිතියත් නෑ… ලීටරයේ පරිමාවත් නෑ… තෙල් සමාගම් සමග එක්ව ආණ්ඩුව ජනතාවගෙන් ගසා කන්නේ මෙහෙමයි…</u>***

- ✓ ***<u>නැවෙත් ගොඩ බාන්නෙත් නැති අමුතු තෙල් වර්ගයක් IOC පිරවුම්හල් විකුණනවා…</u>***

වත්මන් රජය යටතේ මෙරට ඉන්ධන පාරිභෝගික ජනතාව දැඩි අසාධාරණයකට, අයුක්තියකට සහ සූරාකෑමකට ලක්ව ඇති බව ජාතික නිදහස් පෙරමුණේ ජාතික සංවිධායක ජයන්ත සමරවීර මහතා අද උදේ (20) බත්තරමුල්ල පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී අනාවරණය කළේය.

අද වන විට රට තුළ පවතින අධික ඉන්ධන මිල හමුවේ වැට් සහ ආනයන බදු ඉවත් නොකර පාරිභෝගිකයා පිට අධික බරක් පටවා ඇති අතර, ඊටත් වඩා බරපතළ තත්ත්වය වන්නේ අධික මිලක් ගෙවා ලබාගන්නා ඉන්ධනවල නිසි කාර්යක්ෂමතාවයක් සහ ප්‍රමිතියක් නොමැති වීම බව හෙතෙම පෙන්වා දුන්නේය. විදුලි හා ජල පාරිභෝගිකයන්ට අසාධාරණයක් සිදුවූ විට මහජන උපයෝගීතා කොමිසම (PUCSL) හරහා සහනයක් ලබාගැනීමට යාන්ත්‍රණයක් තිබුණද, ඉන්ධන පාරිභෝගිකයා වෙනුවෙන් එවැනි කිසිදු නියාමන ආයතනයක් ක්‍රියාත්මක නොවීම නිසා ජනතාව අන්ත අසරණ තත්ත්වයකට පත්ව ඇතැයි ඔහු සඳහන් කළේය.

විශේෂයෙන්ම යතුරුපැදි, ත්‍රිරෝද රථ, මෝටර් රථ සහ වෑන් රථ හිමියන් ඉන්ධන ලීටරයකින් වෙනදා ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය අද වන විට ධාවනය කිරීමට නොහැකි බවට දැඩි මැසිවිලි නගන බවත්, ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගෙන් කළ විමසීම්වලදී මෙම වංචාවන් තහවුරු වී ඇති බවත් ඔහු පැවසීය.

මෙම ඉන්ධන අර්බුදය සහ ජාවාරම් පිටුපස ඇති ප්‍රධාන කරුණු කිහිපයක් ජාතික නිදහස් පෙරමුණ මෙලෙස පෙන්වා දෙයි:

### බෙදුම්කරුවන්ගේ කොමිස් කප්පාදුව සහ මීටර් වෙනස් කිරීම:

ලංකාවේ ඉන්ධන පිරවුම්හල් 800ක් පමණ හිමි ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), බෙදුම්කරුවන්ට මීට පෙර ගෙවූ 3%ක ලාභ ප්‍රතිශතය 1.5% දක්වා අත්තනෝමතික ලෙස අඩු කර ඇත. අධිකරණ නියෝගයක් ලැබුණද එය නොතකා අභියාචනා කරමින් සංස්ථාව මෙම අඩු කිරීම පවත්වාගෙන යයි. මේ හේතුවෙන් සේවක වැටුප් හා නඩත්තු වියදම් පියවාගත නොහැකිව පිරවුම්හල් වැසී යාමේ තර්ජනයක් මතුව ඇති අතර, පාඩුව පියවා ගැනීමට ඇතැම් පිරවුම්හල්කරුවන් පොම්ප මීටර් වෙනස් කර පෙට්‍රල් ලීටරයකින් මිලිලීටර් 150-200ක් අතර ප්‍රමාණයක් වංචා කරන බව අනාවරණය වී ඇත.

### භූමිතෙල් කලවම් කිරීම:

පවතින පාඩුව පියවා ගැනීම සඳහා ලීටර් 6,600ක පෙට්‍රල් තොගයකට භූමිතෙල් ලීටර් 300-400ක් පමණ අනවසරයෙන් මිශ්‍ර කර බාල තෙල් අලෙවි කිරීමේ ජාවාරමක් ක්‍රියාත්මක වන බවත්, එමගින් වාහන වලට හානි සිදුවන අතරම ධාවන කාර්යක්ෂමතාව බිඳවැටෙන බවත් චෝදනා කෙරේ.

### පරණ පොම්ප භාවිතය සහ නියාමනයක් නොමැතිකම:

කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව හෝ CPC ප්‍රාදේශීය කළමනාකරුවන් මාස 6කට වරක් සිදුකළ යුතු මීටර් පරීක්ෂා කර මුද්‍රා තැබීම් නිසි පරිදි සිදු නොකරන බවත්, වසර 20-30ක් පැරණි දෝෂ සහිත පොම්ප හරහා පාරිභෝගිකයා අඛණ්ඩව රැවටීමට ලක්වන බවත් පැහැදිලි කෙරිණි.

### IOC සමාගමේ අනවසර 'ඔක්ටේන් 93' විකිණීම:

ලංකාවට ආනයනය කිරීම සඳහා ජාත්‍යන්තර භාණ්ඩ වර්ගීකරණ පද්ධතියේ (HS Code) කිසිදු ලියාපදිංචියක් නොමැති 'ඔක්ටේන් 93' නමින් ඉන්ධන වර්ගයක් IOC පිරවුම්හල් හරහා පමණක් නීතිවිරෝධී ලෙස අලෙවි කරමින් සිටී. ඔක්ටේන් 92 පෙට්‍රල් වලට යම් රසායනික ද්‍රව්‍ය (Additives) එක්කර, රුපියල් 67ක් පමණ වැඩි මිලකට එය අලෙවි කරමින් පාරිභෝගිකයා ගසාකන බව සමරවීර මහතා චෝදනා කළේය.

### ඉන්ධන මිල සූත්‍රය අතුරුදන් වීම:

පසුගිය පාලන සමයේ දූෂණ චෝදනා එල්ල වුවද මාස්පතා ඉන්ධන මිල සූත්‍රය (Price Formula) ප්‍රසිද්ධ කළ බවත්, එමගින් නැව් ගාස්තු, ගුදම් ගාස්තු සහ බදු ප්‍රමාණයන් ජනතාවට දැකගත හැකි වූ බවත් ඔහු

සිහිපත් කළේය. එහෙත් විනිවිදභාවය ගැන කතා කරමින් බලයට පත් වත්මන් රජය, වසර දෙකකට ආසන්න කාලයක් ගතවී ඇතත් මිල සූත්‍රය ඉදිරිපත් නොකරමින් පාරිභෝගිකයාගේ සාක්කුවට තට්ටු කරන බවට චෝදනා එල්ල විය.

මේ සම්බන්ධයෙන් වගකිවයුතු අමාත්‍යාංශය, අමාත්‍යවරයා සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නිද්‍රාශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව පෙන්වා දෙන ජාතික නිදහස් පෙරමුණ, පහත කරුණු 3 වහාම ඉටුකරන ලෙස රජයට බලකර සිටී:

වැඩි මිලක් ගෙවා බාල තෙල් ලබාගන්නා පෙට්‍රල් පාරිභෝගිකයා මුහුණ දෙන අසාධාරණය හා පීඩාව වැළැක්වීමට වහා ක්‍රියාමාර්ග ගැනීම.

ආනයනය නොකරන 'ඔක්ටේන් 93' නීතිවිරෝධී ලෙස විකුණමින් IOC සමාගම සිදුකරන මහා ගසාකෑම වහා නැවැත්වීම.

ඉන්ධන වල සැබෑ පිරිවැය සහ බදු ප්‍රමාණය ජනතාවට හෙළිවන පරිදි මාස්පතා ක්‍රියාත්මක වන ඉන්ධන මිල සූත්‍රය වහාම ක්‍රියාත්මක කිරීම.

***<u>ජාතික නිදහස් පෙරමුණේ ජාතික සංවිධායක ජයන්ත සමරවීර මහතා</u>***

***<u>බත්තරමුල්ල පක්ෂ කාර්යාලයේ කරන ලද කතාව.</u>***

මාධ්‍යවේදී සහෝදරවරුනි,

අද මෙම මාධ්‍ය හමුව සඳහා අපත් සමඟ ජාතික නිදහස් පෙරමුණේ බියගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජාතික නිදහස් පෙරමුණේ ජාතික මෙහෙයුම් කමිටු සාමාජික චරිත ජයසුන්දර සහෝදරයාත්, ඒ වගේම ජාතික නිදහස් පෙරමුණේ හෝමාගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩෙරික් පල්ලගේ සහෝදරයාත් අපත් සමඟ එකතු වෙනවා.

අද ඔබ මඟින් අපි අනාවරණය කරන්න බලාපොරොත්තු වෙන්නේ, විශේෂයෙන්ම අපේ රටේ ඉන්ධන පාරිභෝගිකයන් මුහුණ දෙන ඉතාම බලවත් අයුක්තියක් පිළිබඳ, අසාධාරණයක් පිළිබඳව ඛනිජ තෙල් බලධාරීන්ගේ ඇස් අරවන්නයි අපි මේ බලාපොරොත්තු වෙන්නේ.

ඔබ අපි කවුරුත් දන්නවා අපේ රටේ ඉන්ධන මිල අද ඉතාම ඉහළ ඉන්ධන මිලක් අපිට ගෙවන්න සිද්ධ වෙලා තියෙනවා. ඉන්ධන වල වැට් එක ඉවත් කරන්නෙත් නැහැ, බදු ඉවත් කරන්නෙත් නැහැ. වැටුත් ගහනවා, වැට් බද්දත් ගහනවා, සේරම ආනයන බදුත් ගහනවා. ඒ බදුත් එක්ක අපිට ඉන්ධන විකුණනවා විශාල මිලකට. ඒ අනුව, 92 පෙට්‍රල් ලීටරයක් ඔබ දන්නවා රුපියල් 414යි, 95 [රුපියල්] 495යි, ඔටෝ ඩීසල් ලීටරයක් [රුපියල්] 382යි, සුපර් ඩීසල් ලීටරයක් රුපියල් 478යි, භූමිතෙල් ලීටරයක් [රුපියල්] 285යි. ඉතා විශාල මිලකට තමයි අපි අද ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් ගන්නේ.

හැබැයි දැන් මෙහෙම ගත්තත්, අධික මිලක් ගෙවලා ගන්න ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් වල කාර්යක්ෂමතාවය අඩුයි කියලා ඉන්ධන පාරිභෝගිකයන්ගේ විශාල මැසිවිල්ලක් තියෙනවා, ඉන්ධන කාර්යක්ෂමතාවය අඩුයි කියලා.

හැබැයි මේක කියාගන්න කෙනෙක් නැහැ. දැන් අපි දන්නවා, විදුලි බිලේ ප්‍රශ්නයක් තියෙනවා නම් විදුලි පාරිභෝගිකයාට වන අසාධාරණයක් මහජන උපයෝගීතා කොමිසමට ගිහිල්ලා පැමිණිලි කරන්න පුළුවන්. ඒ අය ඒ පිළිබඳ වගවිභාග කරනවා, ඒක ව්‍යවස්ථාපිත ආයතනයක්. ජල පාරිභෝගිකයාට වුණත් මහජන උපයෝගීතා කොමිසමට ගිහිල්ලා පැමිණිලි කරන්න පුළුවන්, ඒගොල්ලෝ සොයා බැලීමේ වගකීම PUCSL එකට නැත්නම් මහජන උපයෝගීතා කොමිසමට තිබෙනවා. ඒ සඳහා තමයි ඒ ආයතනය ස්ථාපිත කොට තිබෙන්නේ.

නමුත් ඉන්ධන පාරිභෝගිකයන් වෙනුවෙන් එහෙම ආයතනයක් මෙතෙක් ස්ථාපිත කොට නැහැ. පනතේ තිබ්බා වුණත් ස්ථාපිත කොට නැහැ. ඒ නිසා දැන් මේක කියාගන්න කෙනෙක් නැහැ.

විශේෂයෙන් අපේ රටේ පෙට්‍රල් පරිහරණය කරන, පරිභෝජනය කරන පාරිභෝගිකයන් යතුරුපැදිකරුවන්, යතුරුපැදි හිමියන්, ත්‍රීරෝද රථ හිමියන්, මෝටර් කාර් හිමියන්, ඒ වගේම පෙට්‍රල් වලින් දුවන වෙනත් වෑන් ආදී වාහන හිමියන් අද ඉතාම බරපතළ අසාධාරණයකට, අයුක්තියකට වගේම ඒ නිසා පීඩාවකට පත් වෙනවා. මොකක්ද මේ පීඩාව?

ඔවුන් තමන්ගේ රථයට මෝටර් සයිකලයට වෙන්න පුළුවන්, ත්‍රීවීලර් රථයට වෙන්න පුළුවන්, කාර් එකට වෙන්න පුළුවන්, වෑන් එකට වෙන්න පුළුවන් යොදන පෙට්‍රල් වලට සරිලන කිලෝමීටර් සංඛ්‍යාවක් ඒ වාහනයේ ලීටර් වලින් දුවන්න බැහැ, පෙට්‍රල් වලින් දුවන්න බැහැ.

දැන් ත්‍රීරෝද රථ හිමියන් ගත්තොත් මේක ඉතාම බරපතළ ලෙස මේ මැසිවිල්ල, දුක්ගැනවිල්ල තිබෙනවා, මේ පීඩාව තිබෙනවා. ඔවුන් කියන්නේ, දැන් තමන් යොදන පෙට්‍රල් ලීටරයකින් වෙනදා කිලෝමීටර් ගිය ගාන දැන් යන්න බැහැ කියලා. වෙනදා මෝටර් සයිකලයකට පෙට්‍රල් ලීටරයක් ගහලා දුවන ප්‍රමාණය දැන් දුවන්න බැහැ කියලා. වෙනදා කාර් එකකට පෙට්‍රල් ලීටර් 10ක් ගහලා දුවන ප්‍රමාණය දැන් දුවන්න බැහැ කියලා. වෙනදා වෑන් එකකට පෙට්‍රල් ලීටර් 20ක් ගහලා දුවන ප්‍රමාණය දැන් දුවන්න බැහැ කියලා. ඉන්ධන කාර්යක්ෂමතාවය බරපතළ ලෙස අඩු වෙලා තියෙනවා කියලා තමයි මේ පෙට්‍රල් වාහන පාවිච්චි කරන හිමියන්ගේ සහ රියදුරන්ගේ බරපතළ දුක්ගැනවිල්ල තිබෙන්නේ.

දැන් මේ පිළිබඳව අපි ඉන්ධන ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගෙන් හොයලා බැලුවා. හොයලා බැලුවට පස්සේ ඔවුන් කියනවා මේකේ සත්‍යතාවයක් තියෙනවා කියලා. ඒ සත්‍යතාවයට හේතුව තමයි, අපි දන්නවා අපේ රටේ තවමත් ඉන්ධන වෙළඳපොළේ වැඩි පංගුව තිබෙන්නේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට, නැත්නම් CPC එකට. දැන් අපි මේ ඛනිජ තෙල් වෙළඳපොළේ පංගුව ඉන්ධන පිරවුම්හල් අනුව ගත්තොත්, CPC එකට තියෙනවා ඉන්ධන පිරවුම්හල් 800ක් ලංකාවේ. ඒ වගේම ඉන්දියන් ඔයිල් සමාගමට (IOC එකට) තියෙනවා 270ක්, චීන සමාගම වෙච්ච සයිනොපෙක් එකට තියෙනවා 150ක්, RM Parks නැත්නම් ෂෙල් සමාගමට තියෙනවා 130ක්. මේ ආදී වශයෙන් තමයි ඉන්ධන පිරවුම්හල් ප්‍රමාණය ලංකාවේ ස්ථාපිත වෙලා තිබෙන්නේ, බෙදිලා තිබෙන්නේ. මේ ප්‍රමාණයෙන් තමයි ලංකාවේ ඉන්ධන වෙළඳපොළ සකස් වෙලා තිබෙන්නේ.

දැන් ඉන්ධන පිරවුම්හල් 800ක් තියෙන, නැත්නම් බෙදුම්කරුවන් 800 දෙනෙක් ඉන්න CPC එකට මීට පෙර ඒගොල්ලන්ගේ ලාභ ප්‍රතිශතය 3%ක් ඒගොල්ලන්ට ගෙව්වා. 3%ක ලාභ ප්‍රතිශතයක් ගෙව්වා ඉන්ධන CPC නැත්නම් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන බෙදුම්කරුවන්ට, පිරවුම්හල් හිමියන්ට, බෙදුම්කරුවන්ට 3%ක ලාභ ප්‍රතිශතයක් ගෙව්වා. නමුත් දැන් ගෙවන්නේ ඒක 1.5%යි.

ඔවුන් මේ පිළිබඳව නඩුවක් දැම්මා. ඒ නඩුවෙන් ඔවුන්ට නියම වුණා, තෙල් සංස්ථාවට නියම වුණා 3%ක් ගෙවන්න කියලා. නමුත් මොකද වුණේ? තෙල් සංස්ථාව මේක ගිහිල්ලා නැවත වතාවක් අභියාචනා කළා. ඒ හින්දා දැන් ගෙවන්නේ 1.5%යි.

එතකොට මේ 1.5%ත් ඉන්ධන පිරවුම්හල් හිමියන් කියන්නේ, 1.5%ත් තමන්ට මේ කර්මාන්තයේ ඉන්න බැහැ කියලා. ඒගොල්ලොන්ට සේවක පඩි නඩි, ඒ සේවකයන්ට ETF, EPF, ඊළඟට විදුලි බිල, ජල බිල ආදී නඩත්තු කටයුතු කරගන්න බැහැ මේ ලාභ ප්‍රතිශතය ප්‍රමාණවත් නැහැ කියලා.

ඒ අනුව දැන් ෂෙඩ්, පිරවුම්හල් වැහෙනවා. අන්න බණ්ඩාරවෙල තිබ්ච්ච ඉතාම ලංකාවේ පැරණිම, හොඳම ඉන්ධන පිරවුම්හලක්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් පිරවුම්හලක් ඒක දැන් වැහුණා. මේ විදිහට දැන් ෂෙඩ් වහන්න තමයි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බෙදුම්කරුවන්ට සිද්ධ වෙලා තියෙන්නේ මේ ප්‍රතිශතය ප්‍රමාණවත් නොවන නිසා.

දැන් වහන්න බැරි, විශාල ප්‍රාග්ධනයක් යොදලා තමයි, ආයෝජනය කරලා තමයි මේ ෂෙඩ් එකක් නැත්නම් ඉන්ධන පිරවුම්හලක් ආරම්භ කරලා තියෙන්නේ. ඒ නිසා වහන්න බැරි අය මොකද කරන්නේ? වහන්න බැරි අය කරන්නේ විවිධ අක්‍රමිකතා හරහා තමන්ගේ තමන්ට නොලැබෙන ලාභ ප්‍රතිශතය ලබා ගැනීමට කටයුතු කරනවා.

ඒක තමයි මේ අපිට CPC ඉන්ධන පිරවුම්හලකින් අපි මෝටර් සයිකලයකට නැත්නම් යතුරුපැදියකට පෙට්‍රල් ලීටරයක් ගැහුවොත්, ඒ පෙට්‍රල් ලීටරයෙන් අපිට හම්බවෙන්නේ මිලිලීටර් 800ක්, 900ක්. ඒ කියන්නේ මිලිලීටර් 200ක් විතර එන්නේ නැහැ, වදින්නේ නැහැ.

මේක කොහොමද වෙන්නේ? ඒක වෙන්නේ ඔබ දන්නවා මේ ඉන්ධන පිරවුම්හල් වල තියෙන පොම්පේ නැත්නම් ඒකට අදාළ මීටරේ, කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව මාස හයකට වරක් ඇවිදිල්ලා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රාදේශීය කළමනාකරුවෙක් සමඟ ඇවිදිල්ලා මේක පරීක්ෂා කරලා බලලා, මුද්‍රා තියලා තමයි මාස හයකට සැරයක්වත් මේ මුද්‍රාව අලුත් කරන්න ඕනා.

දැන් ඉන්ධන පිරවුම්හල් වල අයිතිකරුවන්, ඉන්ධන පිරවුම්හල්කරුවන් දැන් කරන්නේ මොකක්ද? මේ පොම්පේ මීටරය ඒ විදිහට මාස හයෙන් හයට අලුත් කරලා සීල් කරන්නේ නැහැ. ඒ වෙනුවට කරන්නේ එක එක විදිහට මේ මීටරය වෙනස් කරගෙන තියෙනවා. මේ මීටරය වෙනස් කරාට පස්සේ ඇයි තමන්ට ලාභ ප්‍රතිශතයක් එන්නෙත් නැහැ, ප්‍රාදේශීය කළමනාකරුවෝ ඒ පිළිබඳව හොයලා බලන්නෙත් නැහැ, කිරුම් මිනුම් දෙපාර්තමේන්තුවත් අල්ලගන්නවා අල්ලගෙන මේ මීටරය වෙනස් කරනවා. පාරිභෝගිකයා ගිහිල්ලා පෙට්‍රල් තමන්ගේ යතුරුපැදියට පෙට්‍රල් ලීටරයක් ගැහුවට පස්සේ ඒකෙන් එන්නේ 800යි, 900යි. මිලිලීටර් 200ක්, 150ක් ලැබෙන්නේ නැහැ. එතකොට එක පැත්තකින් දුවන ප්‍රමාණය අඩු වෙනවා, කාර්යක්ෂමතාවය අඩු වෙනවා. ඔන්න එක විදියක්.

අනිත් එක තමයි, දැන් ඔබ දන්නවා මේගොල්ලන්ගේ ලාභ ප්‍රතිශතය අඩු වීම නිසා මේගොල්ලෝ තවත් කරන මහා වංචාවක් තියෙනවා. ඒ තමයි සාමාන්‍යයෙන් පෙට්‍රල් තොගයක් කියන්නේ ලීටර් 6,600ක්. මේ පෙට්‍රල් තොගයට ඒගොල්ලෝ කරන්නේ, ගෙනැල්ලා ටැංකියට බැවට පස්සේ නැත්නම් බවුසරයේ තියෙද්දිමවත් වෙනවා කියලා තමයි කියන්නේ, භූමිතෙල් ලීටර් 300ක්, 400ක් මේකට යොදනවා. එතකොට 6,600කට භූමිතෙල් ලීටර් 400ක් විතර දැම්මහම 7,000ක් විතර වෙනවා. එතකොට අපිට හම්බවෙන්නේ පෙට්‍රල් සමඟ භූමිතෙල්. පෙට්‍රල් වලට භූමිතෙල් කලවම් කරලා තමයි පෙට්‍රල් පාරිභෝගිකයාට හම්බවෙන්නේ. එතකොට මොකද වෙන්නේ? එතකොටත් කාර්යක්ෂමතාවය බරපතළ ලෙස අඩු වෙනවා. එතකොට මේක අනිත් පැත්තෙන් වාහන වලට හොඳත් නැහැ. තනුක කරපු පෙට්‍රල්, භූමිතෙල් වලින් තනුක කරපු පෙට්‍රල් තමයි හම්බවෙන්නේ.

එතකොට මේ අක්‍රමිකතාවය ඔවුන්ට අද කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ තමන්ගේ ලාභ ප්‍රතිශතය 3% සිට 1.5% දක්වා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අඩු කරපු හින්දා. අඩු කරාට අධිකරණයට ගිහිල්ලා අඩු කරපු එක වැරදියි කියලා කිව්වත් ඒක නොදී මේක අභියාචනා කර කර තියාගෙන ඉන්න හන්දා.

ඊළඟ එක තමයි, දැන් මේ අය ඛනිජ තෙල් බෙදුම්කරුවෝ කියන අනිත් කාරණය තමයි තමන්ට දැන් මේ මැෂින්, ඉතාම පරණ පොම්ප තමයි මේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන පිරවුම්හල් වල තියෙන්නේ. ඉතාම පරණ පොම්ප, අවුරුදු 20, 30 ගණන් පාවිච්චි කරපු පොම්ප. මේ පොම්ප වල තෙල් යොදලා යොදලා පාවිච්චි කරලා කරලා මේ පොම්ප නිවැරදිත් නැහැ. එතකොට වෙනස් කරන්න ඕනෙත් නැහැ, නිවැරදිත් නැහැ. එතකොට කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව බලන්නෙත් නැහැ, ප්‍රාදේශීය වාර්තාකරුවන් CPC එකේ බලන්නෙත් නැහැ, අමාත්‍යාංශය මේවා ගැන වගේ වගකුත් නැහැ. අවසාන වශයෙන් වැඩි මිලක් යොදලා තෙල් ගහන මේ පාරිභෝගිකයන්ගේ කරට, පෙට්‍රල් පාරිභෝගිකයන් කරට මේක ගිහින් තියෙනවා. ඔවුන්ට තමන් ගෙවන මුදලට සරිලන උසස් වර්ගයේ පෙට්‍රල් 92 නම් නියමිත 92 වර්ගයේ පෙට්‍රල් ලීටරයක් ලැබෙන්නෙත් නැහැ, 95 වර්ගය නම් 95 වර්ගයේ පෙට්‍රල් ලීටරයක් ලැබෙන්නෙත් නැහැ. ඔවුන්ට ලැබෙන පෙට්‍රල් වලින් ඒ ඉන්ධන කාර්යක්ෂමතාවය ඔවුන් වෙනදා දුවපු කිලෝමීටර් සංඛ්‍යාව අද දුවන්න වෙන්නෙත් නැහැ. මේක එක ප්‍රධාන එකක්.

මේකෙ තව විශාල වංචාවක් කරනවා IOC සමාගම. ඒ මොකක්ද? දැන් ඕගොල්ලෝ බලන්න හොයලා, IOC සමාගමේ තියෙනවා ලංකාවේ ෂෙඩ්, පිරවුම්හල් 270ක්. ඒ 270 තියෙනවා 'ඔක්ටේන් 93' කියලා තෙල් විශේෂයක්, 93. ඒක නැහැ CPC පිරවුම්හල් වල නැහැ, RM Parks පිරවුම්හල් වල නැහැ, සයිනොපෙක් පිරවුම්හල් වල නැහැ. ඒක තියෙන්නේ IOC පිරවුම්හල් වල විතරයි ඔක්ටේන් 93. 93 කියන එකක් ලංකාවට ගේන්නේ නැහැ.

අපි රේගුවෙන් බැලුවා HS Code එක අනුව. ඒ කියන්නේ ජාත්‍යන්තර භාණ්ඩ වර්ගීකරණ පද්ධතිය අනුව අපි බැලුවා 93ට අදාළ HS Code එකක් තියෙනවද කියලා. එහෙම ආනයනය කරද්දී ඔබගොල්ලෝ දන්නවා ජාත්‍යන්තර භාණ්ඩ වර්ගීකරණයේ කේත පද්ධතිය අනුව තමයි අපේ රටට භාණ්ඩ ආනයනය කරන්නේ ඔක්ටේන් 92ට HS Code එකක් තියෙනවා, ඔක්ටේන් 95ට HS Code එකක් තියෙනවා, සුපර් ඩීසල් වලට HS Code එකක් තියෙනවා, ඔටෝ ඩීසල් වලට HS Code එකක් තියෙනවා. හැබැයි 93ට නැහැ. එහෙනම් කොහොමද මේ 93ක් ආනයනය නොකරන එකක් කොහොමද විකුණන්නේ?

මේගොල්ලෝ කරන්නේ IOC සමාගම, 92ට ඇඩිටිව්ස් (Additives) කියලා අමතර රසායනික විශේෂයක් යොදනවා. යොදලා ඒක දෙන්නේ රුපියල් 67ක් විතර වැඩියෙන්. ඉතින් මේක නීති විරෝධියි. IOC එකට විතරක් විශේෂ වරප්‍රසාදයක්. ඒක CPC එකට ඇත්තෙත් නැහැ, ඒක RM Parks සමාගමට ඇත්තෙත් නැහැ, ඒක සයිනොපෙක් සමාගමට ඇත්තෙත් නැහැ.

එතකොට මේවා දිහා අද කවුරුත් බලන්නේ නැහැ, ඒකයි ප්‍රශ්නය. මේකෙ බරපතළම ප්‍රශ්න තමයි මේවා දිහා කවුරුවත් බලන්නේ නැහැ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නිදි, එතකොට ඛනිජ තෙල් අමාත්‍යාංශය නිදි. එතකොට මේගොල්ලෝ නිද්‍රාශීලීව ඉන්නවා, බලන්නේ නැතුව ඉන්නවා, හොයන්නේ නැතුව ඉන්නවා, අද ගොළු බිහිරි වගේ ඛනිජ තෙල් බලධාරීන් ඉන්නවා. මේ අපේ අහිංසක පාරිභෝගිකයන් වැඩි මිලක් දීලා බාල තෙල් ගහනවා. වැඩි මිලක් දීලා බාල තෙල් ගහනවා, ලංකාවට ආනයනය නොකරන තෙල් ගහනවා, නීති විරෝධීව IOC සමාගමේ තෙල් ගහනවා. ඉතින් ඒ නිසා මේකේ අවසාන වග උත්තරකාරයා වෙලා තියෙන්නේ අපේ පාරිභෝගිකයන්.

ඉතින් ඒ නිසා අපි, එකක්: වහාම ඛනිජ තෙල් බලධාරීන්ට අමාත්‍යාංශය, අමාත්‍යවරයාට, ලේකම්වරයාට ඇතුළු ඛනිජ තෙල් බලධාරීන්ට, අනිත් පැත්තෙන් ලංකාවේ ලොකුම පංගුව තවමත් සිදු කරන, ලොකුම පංගුවට දායක වන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බලධාරීන්ට කියනවා, මේ බාල තෙල් විකිණීමේ ජාවාරම වහාම සොයා බලලා මේ පාරිභෝගිකයන් විඳින පීඩා, ඔවුන්ට සිදුව තිබෙන අසාධාරණය, ඔවුන්ට සිදුව තිබෙන අයුක්තිය වැළැක්වීම සඳහා කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

ඒ වගේම තමුන්නාන්සේලා දන්නවා මේකේ අනිත් කාරණය තමයි, මේ අද අපි දන්නේ නැහැ, පාරිභෝගිකයා දන්නේ නැහැ ඉන්ධන වෙනදා නම් මීට අර මේ ඛනිජ තෙල් වලින් විශාල ගසාකෑමක් සිදුකළා කියන දැන් ප්‍රකට නමන්නේ කාංචන විජේසේකර අමාත්‍යවරයා ඉන්දැද්දී විශාල ලෙස හොරා කෑවා කියලානේ කිව්වේ. විවේචනයක් තිබ්බා, විශාල විවේචනයක්. ලොමු ඩැහැගැන්වෙන විවේචනයක් තිබ්බා, ඔහුට විශාල කොමිස් කුට්ටි මේ ඛනිජ තෙල් ව්‍යාපාරයෙන් යනවා කියලා. හැබැයි ඒ කාලේ ඉන්ධන මිල සූත්‍රය, Price Formula එක මාස්පතා දැම්මා. එතකොට අපි දන්නවා මෙන්න ඉන්ධන ගේන මිල, ආනයන මිල මෙකයි, 92 පෙට්‍රල් ලීටරයක් ලංකාවට ආනයනය වෙන්නේ මේකයි, මේ විදිහට. ඒකෙ

බදු මෙන්න මේ ප්‍රමාණයක් ආනයන බදු, නැව් ගාස්තු, ගුදම් ගාස්තු, ආනයන ගාස්තු, ඒ වගේම වැට් බදු, මේ ආදී වශයෙන් මේ ඇතුළත් වෙන පිරිවැය අපි දන්නවා, පාරිභෝගිකයාට බලාගන්න පුළුවන්කමක් තිබුණා.

හැබැයි දැන් මේ ඉතාම පාරදෘශ්‍යභාවයෙන් මේ වෙළඳාම කරනවයි කියලා ආපු උදවිය, වරායෙන් දෙන මිලට දෙනවා කියලා ආපු උදවිය, දැන් ඕගොල්ලෝ කල්පනා කරලා බලන්න දැන් අවුරුදු දෙකක් ගත වෙනවා මේ ආණ්ඩුව ඇවිදිල්ලා තව නොබෝ දිනකින්, තව මාසෙකින් විතර. දැන් මිල සූත්‍රයක් නැහැ. දැන් අපි දන්නේ නැහැ කීයටද ආනයනය කරන්නේ, බදු ප්‍රමාණය කොච්චරද, මේක පාරිභෝගිකයා දන්නේ නැහැ. මිල සූත්‍රයක් ඉදිරිපත් කරන්නේ නැහැ. ආන්න රහස. මිල සූත්‍රයක් ඉදිරිපත් නොකර මේ ඇතුලෙන් පාරිභෝගිකයාගේ සාක්කුවට තට්ටු කරන වැඩේත් ඒ අස්සේ යනවා.

ඒ නිසා අපි ආණ්ඩුවට බලකරලා කියනවා, තමුන්නාන්සේලා ඉතිහාස ආණ්ඩු වලට විවේචනයක් කළා තෙල් වලින් හොරා කනවා කියලා. හැබැයි හොරා කාපු ආණ්ඩුව තෙල් මිල සූත්‍රය ඉදිරිපත් කළා. මාස්පතා තෙල් මිල සූත්‍රය ඉදිරිපත් කළා. හැබැයි තමුන්නාන්සේලා, මේ මහා ශුද්ධවන්ත ආණ්ඩුව තෙල් මිල සූත්‍රය ඉදිරිපත් කරන්නේ නැහැ. ඇයි ඒ? ඉදිරිපත් නොකරන්නේ ඇයි? එතන තමයි රහස.

ඒ හින්දා තෙල් මිල සූත්‍රය වහාම ඉදිරිපත් කරන්න. එතකොට පාරිභෝගික ජනතාවට දැනගන්න පුළුවන් කොහොමද තමුන්නාන්සේලා මේ තෙල් වලින් තමුන්නාන්සේලා ඇතුලත් කරලා තියෙන බදු බර කොච්චරද, මේවට තියෙන මේවා ඇතුලේ තියෙන අසාධාරණ, අයුක්ති සහගත ගාස්තු මොනවද කියලා.

ඒ නිසා මේ කාරණා දෙක අපි අවධාරණය කරනවා ඛනිජ තෙල් අමාත්‍යවරයාට, ඛනිජ තෙල් අමාත්‍යාංශයේ බලධාරීන්ට, ඒ වගේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බලධාරීන්ට අපි අවධාරණය කරනවා:

1. එකක්: වැඩි මිලක් දීලා විශේෂයෙන් අපේ පෙට්‍රල් පාරිභෝගිකයා වැඩි මිලක් දීලා බාල තෙල් පරිභෝජනය කරනවා. ඔවුන්ගේ ඉන්ධන කාර්යක්ෂමතාවය ඒ නිසා අඩු වෙලා තියෙනවා, ඔවුන් බරපතළ අසාධාරණයක්, අයුක්තියක් විඳිනවා, පීඩාවක් විඳිනවා, මේක වහාම වළක්වන්න පියවර ගන්න.

2. දෙක තමයි: ඉන්දියානු තෙල් සමාගම හොරට තෙල් විකුණනවා ලංකාවේ, ආනයනය නොකරන තෙල් විශේෂයක් විකුණලා විශාල වශයෙන් පාරිභෝගිකයාව ගසාකනවා. මේක නවත්තන්න වහාම පියවර ගන්න.

3. තුන්වෙනි කාරණය තමයි: වහාම තෙල් මිල සූත්‍රය මාසෙන් මාසෙට ඉදිරිපත් කරලා පාරිභෝගිකයාට මේ තෙල් වල තිබෙන පිරිවැය දැන ගැනීමට අවශ්‍ය කටයුතු කරන්න, ඒ අයිතිය පාරිභෝගිකයාට දෙන්න කියන එක අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා. බොහොම ස්තූතියි.

මාධ්‍යවේදියෙකු ප්‍රශ්නයක් නගයි.

ප්‍රශ්නය: 22 වැනි සංශෝධනය පෙරේදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඔබතුමාලා මොකක්ද ඒ ගැන දරන අදහස?

ජයන්ත සමරවීර මහතා: මේ පිළිබඳව අප දිගින් දිගටම 22 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡාව පැවැත්වෙද්දීම, මේ පිළිබඳ කැබිනට් අනුමැතිය ලබා දෙද්දීම අප මේ පිළිබඳ ඉතාම දැඩි විවේචනයක් අපි ඉදිරිපත් කළා, දැඩි විරෝධයක් අපි ඉදිරිපත් කළා.

මේ ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වයට ගිනි බඳින, අධිකරණයේ ස්වාධීනත්වය නැතිභංග කරන, මුළුමණින්ම විනාශ කරන මහා ප්‍රජාතන්ත්‍ර විරෝධී සංශෝධනයක්. රට ඒකාධිපතිත්වයකට, ආඥාදායකත්වයක් කරා ගෙන එන සංශෝධනයක්. ඒ නිසා මේක වහාම අකුලා ගන්න කියන බලපෑම, විරෝධය අප මේ සාකච්ඡාව ආරම්භ වෙන මුල් පැයේ ඉඳන්ම ඉදිරිපත් කළා. ඉතින් අපේ ඒකේ කිසි වෙනසක් නැහැ. අදත් අපි ඉන්නේ, දැනුත් අපි කියන්නේ මේ සංශෝධනය හකුලා ගන්න ඕනේ. හකුලා ගන්න ඕනේ.

අද මේකට අපි විතරක් නෙවෙයි, දේශපාලන ව්‍යාපාර ලංකාවේ සියල්ලම පාහේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන බලවේග, ඒ වගේම අන් කවරදාවත් ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයකට එදිරිව ක්‍රියාත්මක නොවූ නීතිඥ සංගමය මුළුමණින්ම වගේ, අධිකරණ සේවා සංගමය පළවෙනි වතාවට, ඊළඟට ත්‍රෛනිකායික මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා, සෙසු ආගමික සංස්ථාවන්, ඊළඟට ජාත්‍යන්තර සංවිධාන අද මීට විරුද්ධව මේ ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන ප්‍රතිගාමී තත්ත්වය ගැන, ප්‍රතිගාමී භාවය ගැන, ප්‍රජාතන්ත්‍ර විරෝධී භාවය ගැන අද ඕනෑවටත් වඩා කරුණු කියලා තියෙනවා.

ඉතින් ආණ්ඩුවට විලිලැජ්ජාවක් නැතුව, තමන්ගේම ඉතිහාසයටත් පස්ස හරවලා, නිර්වස්ත්‍රව අද මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරේ තියාගෙනත් යනවා, තව පාරනුත් බානවා අපි මේක සම්මත කරනවා කියලා.

අපි කියන්නේ, සම්මත කරන්න ඕන නම් ආණ්ඩුවේ මහත්වරුන්ට, ජනාධිපතිතුමා ඇතුළු මැති ඇමතිතුමාලට අපි කියන්නේ, මාලිමා ආණ්ඩුවට අපි කියන්නේ: වහාම මහත්වරුනි, මේක ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ බරපතළ ප්‍රශ්නයක්, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ බරපතළ ප්‍රශ්නයක්. බොරු මිත්‍යා මත වපුර වපුර නඩු වැඩි හින්දා මේක කරන්නේ, කාර්යක්ෂමතාවය වැඩි කරන්න හින්දා මේක කරන්නේ කියලා එකිනෙකට පරස්පර බොරු කිය කියා මේ කරන එක, ඔබ කියන්නේ ඇත්තද ඔබ කියන්නේ බොරුද කියලා අපි ජනතාවගෙන් අහමු. ජනතාවගෙන් අහමු.

ඒ නිසා මේක ජනමත විචාරණයකට වහාම ලක් කරන්න. වහාම ලක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා ශ්‍රේෂ්ඨාධිකරණයෙන්, උපරිමාධිකරණයෙන් මේ බැරෑරුම් සංශෝධනය පිළිබඳ ජනතාවගේ මත විමසීමට, ජනතා පරමාධිපත්‍යයේ එකඟතාවය ලබා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය කටයුතු කරයි කියන විශ්වාසයත් අපට තියෙනවා. අපි ඒ පිළිබඳ ඉතාම බලාපොරොත්තු සහගතව බලාගෙන ඉන්නවා.